# ජාතික අධ්‍යාපන ආයතනය

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2011 දෙසැම්බර් 31 දිනට ජාතික අධ්‍යාපන ආයතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.2.1 ගිණුම් ඉදිරිපත් කිරීම

කෙටුම්පත් මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණන පරීක්ෂණ වලදී හෙළිදරව් වූ ගිණුම්වල අඩුවෙන් දැක්වීම් රු.455,211 ක්ද, වැඩියෙන් දැක්වීම් රු.4,915,820 ක්ද පෙන්වා දීමෙන් පසු අවසාන මූල්‍ය ප්‍රකාශන නිවැරදි කර විගණනයට ඉදිරිපත් කරන ලදී.

1.2.2 ලැබිය යුතු ගිණුම්

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) පාසැල් වල ඇගයීම් ප්‍රශ්න පත්‍ර මුද්‍රණය කිරීම වෙනුවෙන් වර්ෂ 3 කට වැඩි කාලයක සිට අධ්‍යාපන අමාත්‍යාංශයෙන් අයවිය යුතුව ඇති රු.3,237,799 ක් සමාලෝචිත වර්ෂය අවසානය වන විටද අයකර ගැනීමට අපොහොසත්ව තිබුණි.

(ආ) සාමාන්‍ය අත්තිකාරම් යටතේ දක්වා තිබූ වර්ෂ 5 කට වැඩි රු.28,302 ක්ද, වර්ෂ 4 කට වැඩි රු.60,431 ක්ද සමාලෝචිත වර්ෂය අවසානය වන විටද පියවා ගැනීමට අපොහොසත්ව තවදුරටත් ඉදිරියට ගෙන එමින් පැවතුණි.

1.2.3 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති, රීති, රෙගුලාසි වලට යොමුව | | විස්තරය |
|---|---|---|
| (අ ) ආයතන සංග්‍රහය | | |
| xv පරිච්ඡේදයේ 3.1,4.2 හා 4.3 වගන්ති සහ xii පරිච්ඡේදයේ 14.2 වගන්තිය | (i ) | පරිවාස කාලයේ නිලධාරීන්ට විදේශ අධ්‍යයනයේ යෙදීමට වැටුප් සහිත නිවාඩු ලබාදීම සඳහා විධිවිධාන සැලසී නොතිබුණද, පරිවාස කාලයේ සිටි සහකාර ව්‍යාපෘති නිලධාරිනියකට 2007 සැප්තැම්බර් 01 සිට 2009 අගෝස්තු 31 දක්වා වැටුප් සහිත නිවාඩු අනුමත කර එම සම්පූර්ණ කාලය වෙනුවෙන් වැටුප් රු.650,160 ක් ගෙවා තිබුණි. නිවාඩු අනුමත කිරීමේදී ආයතනය විසින් ඇය වෙතින් විධිමත් ඇප බැඳුම්කරයකට අත්සන් කරගෙන නොතිබුණි. |
| xii පරිච්ඡේදයේ 23.1 හා 23.2 වගන්ති | (ii) | ඉහත නිලධාරිනිය විසින් 2009 සැප්තැම්බර් 01 සිට 2011 අගෝස්තු 31 දක්වා කාලය සඳහා විදේශ නිවාඩු අනුමත කර ගැනීමකින් තොරව නැවත විදේශගතවී තිබූ අතර එම කාලය වැටුප් රහිත නිවාඩු ලෙස සලකා ආයතනය කටයුතු කර තිබුණි. එම කාලයේ මාස 5 ක් සඳහා වැටුප්, සේවක අර්ථ සාධක හා සේවා නියුක්ති භාර අරමුදල් ලෙස ඇය වෙත රු.154,640 ක් ආයතනය විසින් ගෙවා තිබුණි. |
| v පරිච්ඡේදයේ 7 වගන්තිය | (iii) | නිවාඩු අනුමත කර ගැනීමෙන් තොරව සේවයට වාර්තා නොකළ ඉහත නිලධාරිනිය 2009 සැප්තැම්බර් 01 දින සිට සේවය හැර ගිය ලෙස සලකා ආයතනය කටයුතු කර නොතිබුණි. |
| (ආ) රජයේ මුදල් රෙගුලාසි | | |
| 371 (2 ) සහ (5 ) වගන්ති | | තත්කාර්ය අතුරු අග්‍රිම යටතේ ලබාගන්නා අත්තිකාරම් අදාල කාර්යය නිම කළ විගසම පියවිය යුතු වුවත් ආයතනයේ සැපයුම් නිලධාරී වෙත අවස්ථා 8 කදී ලබාදුන් රු.226,517 ක අත්තිකාරම් පියවීම සඳහා මාස 5 සිට 8 දක්වා කාලයක් ලබාගෙන තිබූ අතර සමාලෝචිත වර්ෂයේදී ලබාගත් අත්තිකාරම් පියවීම 2012 පෙබරවාරි හා මාර්තු තෙක් ප්‍රමාද කර තිබුණ. |

| | |
|---|---|
| 394 (ආ) සහ (ඇ)<br>396 (ආ) සහ (ඇ) (i ) | 2011 දෙසැම්බර් 31 දිනට නිකුත් කර මාස 6 ක් ඉක්මවා තිබුණද, බැංකුව වෙත ඉදිරිපත් නොවූ රු.478,865 ක් වටිනා චෙක්පත් 338 ක් අවලංගු කර ආදායමට බැර කර තිබූ අතර එම චෙක්පත් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාර කටයුතු කර නොතිබුණි. |
| 446 (2 ) | ආයතනය විසින් නඩත්තු කරනු ලබන මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානයේ ඉගෙනුම ලබන දරුවන්ගේ ආහාර වියදම් සඳහා 2011 වර්ෂය ආරම්භයේ රු.20,000 ක අග්‍රිමයක් මුදාහැර තිබූ අතර, මුල් අර්ධ වර්ෂයේ අවස්ථා 16 කදී රු.206,379 ක වියදම් ප්‍රතිපූර්ණය කර තිබුණි. මුදල් රෙගුලාසි ප්‍රකාර මෙම ලැබීම් හා ගෙවීම් සටහන් කිරීම සඳහා ලේඛන පවත්වාගෙන ගොස් නොතිබුණි. |
| 770 හා 772 | මධ්‍යම ගබඩාවේ 2010 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණයේදී අනාවරණය වූ පරිදි ප්‍රයෝජනයට ගත නොහැකි රු.2,287,699 ක් වටිනා භාණ්ඩ වර්ග 42 ක් විකිණීමටත් රු.355,515 ක් වටිනා භාණ්ඩ වර්ග 50 ක් විනාශ කිරීමටත් සමීක්ෂණ මණ්ඩල වාර්තා මගින් නිර්දේශ කර තිබුණද, 2011 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණය සිදු කරන තෙක් එම නිර්දේශිත ක්‍රියා මාර්ග ඉටුකර නොතිබුණි. |

1.2.4 <u>ප්‍රමාණවත් අධිකාර බලයකින් තහවුරු නොවූ ගනුදෙනු</u>

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ ) ජාතික අධ්‍යාපන ආයතනයේ නඩත්තු නිලධාරී (විදුලි ) තනතුර සඳහා බාහිර අයදුම්කරුවෙකු 2011 මැයි 15 දින සිට බඳවා ගෙන එම තනතුරේ අනුමත ආරම්භක වැටුප් පියවර වූ රු.26,970 ක් වෙනුවට වැටුප් පියවර 05 කින් ඉහල දමා රු.30,195 ක වැටුප් තලයේ පිහිටුවා තිබුණි. ආයතන සංග්‍රහයේ vii වැනි පරිච්ඡේදයේ 3 වගන්තියේ විධි විධාන ප්‍රකාර ඒ සඳහා ආයතන අධ්‍යක්ෂගේ පූර්ව අනුමැතිය ලබා නොතිබුණි.

(ආ) 2012 ජනවාරි 23 දින අධ්‍යක්ෂ මණ්ඩල තීරණයක් අනුව, 2011 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ කටයුතු සිදුකළ සමීක්ෂණ මණ්ඩල සභාපතිවරයාට රු.1,500 ක්ද, සමීක්ෂණ මණ්ඩල සාමාජිකයකුට රු.1,000 ක්ද, වශයෙන් දීමනා ගෙවීමට රු.293,000 ක් වැය කර තිබුණි.

අදාල සමීක්ෂණ කටයුතු රාජකාරි වේලාව තුල සිදු කර තිබූ අතර, දීමනා හෝ වෙනත් මූල්‍ය ප්‍රතිලාභ ගෙවීම සම්බන්ධයෙන් 1994 ජුනි 14 දිනැති අංක 95 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ උපදෙස් පරිදි මේ සඳහා නිසි අනුමැතිය ලබාගත් බව විගණනයේදී තහවුරු නොවුණි.

2. <u>මූල්‍ය සමාලෝචනය</u>

2.1 <u>මූල්‍ය ප්‍රතිඵල</u>

මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රතිඵලය රු.41,078,116 ක අතිරික්තයක් වූ අතර ඉකුත් වර්ෂය සඳහා ඊට ප්‍රතිරූපව ඌනතාවය රු.48,544,103 ක් විය. ඉකුත් වර්ෂය හා සසඳන විට සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු. 89,622,219 ක වර්ධනයක් ඇතිවීම සඳහා ප්‍රධාන වශයෙන්ම බලපා තිබුණේ මෙහෙයුම් ආදායම රු.74,472,104 කින් වැඩිවීම සහ සැපයුම් හා පාරිභෝගික ද්‍රව්‍ය වියදම රු.12,098,309 කින්ද මෙහෙයුම් වියදම් රු.9,759,450 කින්ද අඩුවීමයි.

3. <u>මෙහෙයුම් සමාලෝචනය</u>

3.1 <u>කාර්ය සාධනය</u>

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) විවෘත පාසැල් ප්‍රාදේශීය මධ්‍යස්ථාන වැඩ සටහන යටතේ ප්‍රාදේශීය ඉගෙනුම් මධ්‍යස්ථාන වල පවත්වා ගෙන යනු ලබන පාඨමාලා සඳහා ගෘහ හා ප්‍රජා අධ්‍යාපන විෂයට අදාලව සිංහල හා දෙමළ භාෂාවන්ගෙන් සකස් කර තිබූ මොඩියුල 54 න් 34 ක් 2011 දෙසැම්බර් 31 දින තෙක් මුද්‍රණය කර නොතිබුණි. එම මොඩියුල ඉගෙනුම් ලාභීන් අතට පත් නොවීම තුලින් එම පාඨමාලාවන්ගෙන් අපේක්ෂිත අරමුණු නිසි පරිදි ඉටු වී නොතිබුණ.

(ආ) ආයතනය විසින් එහි විභාග දෙපාර්තමේන්තුවට අදාල වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මෙහි වාර්ෂිකව විභාග සංඛ්‍යාවක් පැවැත්වීම, උත්තර පත්‍ර ඇගයීම හා ප්‍රතිඵල නිකුත් කිරීම අදාල වර්ෂය තුලදීම සිදු කිරීමට සැලසුම් කර තිබුණද, 2009 වර්ෂය තුලදී පවත්වන ලද විභාග තුනක හා 2010 වර්ෂයේදී පවත්වන ලද විභාග එකක ප්‍රතිඵල නිකුත් කිරීමට මාස 12 සිට මාස 23 දක්වා කාලයක් ප්‍රමාද වී තිබීමෙන් සැලසුම්ගත පරිදි කටයුතු ඉටු කර නොතිබූ බව නිරීක්ෂණය විය.

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ ) අධ්‍යාපන ක්ෂේත්‍රයේ නිරත නායකයන් සවිබල ගැන්වීම හා කළමනාකරණය හඳුන්වාදීම අරමුණු කරගෙන මුද්‍රණය කරනු ලබන 'අධ්‍යාපන කළමණා ' සඟරාවේ 2007, 2008 හා 2009 වර්ෂයන්ට අදාල 16, 17, 18 හා 19 යන කලාප වලින් මුද්‍රිත ප්‍රමාණයන්ගෙන් පිළිවෙලින් 74 %, 74 %, 87% හා 87 % බැගින් 2011 දෙසැම්බර් 31 දිනටත් ගබඩාවල ඉතිරිව පැවතුනි. එම ඉතිරි තොග වල පිරිවැය වටිනාකම රු.899,800 ක් වන අතර මෙම ප්‍රකාශන අලෙවි කිරීම හෝ ඉලක්කගත කණ්ඩායම් වෙත බෙදා හැරීම සඳහා විධිමත් වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක වී නොතිබුණි.

(ආ) 1999, 2000, 2001 හා 2002 වර්ෂ වලදී අධ්‍යයන කටයුතු සඳහා විදේශගත වූ නිලධාරීන් 8 දෙනෙකු යළි සේවයට වාර්තා නොකිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසානය වන විට අයකර ගත යුතු දණ්ඩන මුදල් හා ඇප බැදුම්කර වල වටිනාකම රු.11,172,910 ක් වූ අතර ආයතනය විසින් අප්‍රමාදවම එම මුදල් අයකර ගැනීමට කටයුතු නොකිරීම හා නීත්‍යානුකූල ක්‍රියාමාර්ග ගැනීම ප්‍රමාදවීම හේතුවෙන් පසු කාලයේදී එම නිලධාරීන් පිළිබඳ තොරතුරු සොයාගත නොහැකිවී තිබුණි.

(ඇ) ජාතික අධ්‍යාපන ආයතනය වෙත නිකුත් කර තිබුණු කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ 2006 නොවැම්බර් 30 දිනැති අංක :DMS/D/I/NIE/SA දරන ලිපියේ vi ජේදයට අනුව ආයතනයේ කාර්ය මණ්ඩලය සඳහා වූ බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටි සංශෝධනය කර එම දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගැනීමට ක්‍රියාකළ යුතු බව දන්වා ඇතත්, 2011 දෙසැම්බර් 31 දින තෙක් එම පරිපාටි සංශෝධනය කර අනුමැතිය ලබාගෙන නොතිබුණි.

(ඈ) ආයතනය විසින් පවත්වා ගෙන යනු ලබන මුල් ළමාවිය සංවර්ධන හා පර්යේෂණ මධ්‍යස්ථානයේ කටයුතු සඳහා පෙර පාසැල් ගුරුවරුන් 4 ක් හා සහාය සේවක අරක්කැමියන් 2 ක් දෛනික හා කැලි පදනම මත සේවයේ යොදවා තිබුණි. ආයතනයේ ප්‍රාථමික අධ්‍යාපන දෙපාර්තමේන්තුව යටතේ වර්ෂ 20 කටත් වැඩි කාලයක සිට පවත්නා මෙම මධ්‍යස්ථානයේ කාර්ය මණ්ඩල අවශ්‍යතා අනුව එම තනතුරු අනුමත කාර්ය මණ්ඩලය තුලට ඇතුළත් කර ගැනීමටත් ඒ අනුව විධිමත් පරිදි බඳවා ගැනීම් සිදු කිරීමට මෙතෙක් පියවර ගෙන නොතිබුණි.

(ඉ) (i) 2007 සහ 2008 වර්ෂ වලදී මුද්‍රණය කර තිබූ පිරිවැය වටිනාකම රු.4,350,644 ක් වූ 6, 7, 10 සහ 11 ශ්‍රේණි වලට අයත් ගුරු මාර්ගෝපදේශ හා විෂය නිර්දේශ 64 කට අදාල පිටපත් 52921 ක්ද, පිරිවැය හඳුනාගත නොහැකි වූ ගුරු මාර්ගෝපදේශ හා විෂය නිර්දේශ 78 කට අදාල පිටපත් 35257 ක්ද පාසැල් වෙත බෙදා හැරීමකින් තොරව 2011 දෙසැම්බර් 31 වන විටත් සංචලනය නොවන තොග ලෙස පොත් ගබඩාවේ රඳවාගෙන තිබුණි.

(ii) පිරිවැය අනාවරණය කරගත නොහැකි වූ උසස් පෙළ විෂය නිර්දේශ පොත් 93 කට අදාල පිටපත් 70157 ක් 2011 දෙසැම්බර් 31 දිනට ගුරුවරුන් වෙත බෙදා නොහැර පොත් ගබඩාව තුල ඉතිරි තොග ලෙස පැවතුණි. එම පොත් වල පිරිවැය ගණනය කර 2011 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශ වල ඇතුලත් කර නොතිබුණි.

(iii) පාසැල් වලට නොමිලේ බෙදා හැරීමට නියමිතව 2009 වර්ෂයේදී මුද්‍රණය කරන ලද 3, 4, 5 ශ්‍රේණි සඳහා වූ ඉංග්‍රීසි කතන්දර පොත් වර්ග 20 කට අදාල පිටපත් 108381 ක් පාසැල් වෙත බෙදා නොහැර ඉතිරි තොග ලෙස 2011 දෙසැම්බර් 31 දිනට ද ගබඩාව තුල පැවතුණි. මේ සඳහා දරන ලද පිරිවැය විගණනයට අනාවරණය නොවුණි.

3.3 <u>මෙහෙයුම් අකාර්යක්ෂමතා</u>

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) (i) ආයතනයේ ඉන්වෙන්ටරි හා පාරිභෝජන භාණ්ඩ තොග තත්ත්වය යාවත්කාලීන කිරීම සඳහා නිර්දේශ ඉදිරිපත් කිරීමට 2010 වර්ෂයේදී පත් කළ කමිටු වාර්තාවේ ඇතුලත් සෙමින් නිකුත් වන රු.3,180,745 ක් වටිනා තොග අයිතම 32 ක ඒකක 24691 ක් නිකුත් වීමකින් තොරව වර්ෂ 5 - 10 ක කාලයක් ගබඩාවේ රඳවා තිබෙන අතර වර්ෂ 10 කට වඩා පැරණි රු.186,590 ක් වටිනා තොගයක් ද 2011 දෙසැම්බර් 31 වන විට තවදුරටත් ගබඩාවේ රඳවා තිබුණි.

(ii) කමිටු වාර්තාව ඉදිරිපත් කර වර්ෂ 1 ක් ඉක්මවා තිබුණද එම වාර්තාවේ සඳහන් කර තිබූ රු.441,380 ක් වටිනා යල් පැනගිය භාණ්ඩ අයිතම 42 ක් අපහරණය කිරීමට කටයුතු නොකර 2011 දෙසැම්බර් 31 දින වන විටත් ගබඩාවේ රඳවා ගෙන තිබුණි.

(ආ) අධ්‍යාපන අමාත්‍යාංශයේ 2009 මැයි 18 දිනැති අංක : 2009/16 චක්‍රලේඛය අනුව, 2009 අගෝස්තු සිට ආරම්භ වන අ.පො.ස. (උසස් පෙළ ) නව විෂය නිර්දේශයේ විෂයයන් 3 කට අදාල ඉංග්‍රීසි මාධ්‍යය ගුරු මාර්ගෝපදේශ සහ විෂයයන් 2 කට අදාල දෙමළ මාධ්‍යය ගුරු මාර්ගෝපදේශ සංග්‍රහ ඇතුලත් සංයුක්ත තැටි සකස් කර මුද්‍රණය සඳහා 2011 දෙසැම්බර් 31 දින වන විටත් අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව වෙත භාරදී නොතිබුණි.

(ඇ) දිගු කලක සිට මධ්‍යම ගබඩාවේ ගබඩා කර තිබෙන පැරණි ටයර් 496 ක් හා ටියුබ් 105 ක් අපහරණය කිරීමට 2011 දෙසැම්බර් 31 දින වන විටත් කටයුතු කර නොතිබූ අතර ඒ තුළින් ගබඩා පිරිවැය අවම කර ගැනීම කෙරෙහි අවධානය යොමු කර නොතිබුණි. වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයන්හිදී මේ පිළිබඳ හෙළිදරව් කර ඇතත්, මෙතෙක් සුදුසු ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ඈ) පාරිභෝජන භාණ්ඩ අවශ්‍යතාවය අනුව ඇනවුම් කර කෙටි කාලයකින් භාවිතය සඳහා ආපසු නිකුත් කිරීමේ ක්‍රම වේදයක් අනුගමනය නොකර ද්‍රව්‍ය අයිතම 11 ක අධි තොග පවත්වා ගෙන ගොස් තිබුණි. මෙම තොගයෙන් වර්ෂ 10 කට වඩා පැරණි වී තිබූ රු.28,842 ක් වටිනා දුඹුරු කඩදාසි (brown paper ) ඒකක 19109 ක තොගයක් 2011 දෙසැම්බර් 31 දින වන විට යල් පැනීම් තත්ත්වයට පත්වී තිබුණි.

4. <u>ගිණුම් කටයුතු භාවය හා යහපාලනය</u>

4.1 <u>ප්‍රසම්පාදන සැලැස්ම</u>

ආයතනය විසින් වර්ෂය තුළදී රු.50,275,852 ක ප්‍රාග්ධන වත්කම් මිලදී ගෙන තිබුණද ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2 ඡේදය හා 2006 මාර්තු 24 දිනැති ජාතික අයවැය චක්‍රලේඛ අංක 128 හි විධි විධාන පරිදි සමාලෝචිත වර්ෂයට අදාලව ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

4.2 <u>අයවැය ලේඛනමය පාලනය</u>

2011 වර්ෂයේ අයවැයගත වියදම් තථ්‍ය දත්තයන් හා සැසඳීමේදී 18 % සිට 56 % දක්වා ප්‍රමාණාත්මක විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී මූල්‍ය පාලන කාරකයක් ලෙස උපයෝගී කරගෙන නොමැති බව නිරීක්ෂණය විය.

5. <u>පද්ධති හා පාලන</u>

විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු පිළිබඳව වරින් වර අධ්‍යක්ෂ ජනරාල්වරයා දැනුවත් කරන ලදී. ඊට අමතරව පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි තවදුරටත් අවධානය යොමු කළ යුතුය.

(අ ) ගබඩා පාලනය
(ආ) පොත් හා ග්‍රන්ථ මුද්‍රණය
(ඇ) අයවැය පාලනය
(ඈ) අධ්‍යයනය සඳහා විදේශ ගමන්
(ඉ ) විභාග පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම